www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔස්ට්‍රේලියාවේ ලැව්ගිනි: රජයේ නොසලකාහැරීමේ ශෝකජනක ප්‍රතිපලයකි

## Australia bushfires: the tragic outcome of government neglect

**රිචඩ් පිලිප්ස් විසිනි**
**2009 පෙබරවාරි 13**

පසුගිය සති අන්තයේ වික්ටෝරියාවට බලපෑ ලැව්ගිනි හේතුවෙන් ඇති වූ බරපතල ජීවිත හානි පිලිබද නවතම විස්තර දිනෙන් දින වාර්තාවන අන්දමට, ආන්ඩුවේ නොසලකා හැරීම්, හදිසි සේවාවල කඩාවැටීම් සහ කිසිදු විස්තරාත්මක සැලැස්මක් නොමැති වීම, මෙම ශෝකජනක ජීවිත හානිවලට සෘජු දායකත්වය සැපයූ බවට සාක්ෂි ගලා එමින් පවතී.

නිල මරන සංඛ්‍යාව 181 ක් වුවත්, ගිනිබත්වුන නිවාස 1,000 ට වැඩි ප්‍රමානයක පොලිස් හා හමුදා සොල්දාදුවන් විසින් මල සිරුරු සෙවීම් කටයුතු කරගෙන යනු ලබන නිසා අවසන් අගය 300 ට වඩා වැඩිවිය හැකි බවට බලාපොරොත්තු වේ.

කි.මී. 450,000 කට වැඩි ප්‍රමානයක්, පාසල් 100 ක්, සුලු ව්‍යාපාර සහ ප්‍රාදේශීය පහසුකම් ගිනිබත්කරන ලද ගිනිජාලාව මගින් මේ වනවිට 5,000 ක ජනතාව අවතැන් කොට ඇත. සම්ප්‍රදායික ඇස්තමේන්තු අනුව ඩොලර් බිලියන 2 ඉක්මවා ඇති දේපල අහිමිවීම් සමග බොහෝ නිවාස හිමියෝ මූල්‍යමය බංකොලොත්භාවයට මුහුන දෙති. ඔස්ට්‍රේලියානු රක්ෂන කවුන්සිලයට අනුව, මෙම තත්වයට මුහුන පා ඇති 5 දෙනෙකුගෙන් එක් අයෙකුට රක්ෂන ආවරනයක් නොතිබිය හැක.

මෘදු කාලගුනික තත්වයන් සහ බදාදා හා බ්‍රහස්පතින්දා ඇතිවූ වැසි හේතුවෙන් රටේ සමහර පැතිවලට සහනයක් ගෙන දුන්නත්, බොහෝ නගර අනතුරට පත්කරමින් දූසිමකට වැඩි ගිනි තවමත් ඇවිලෙමින් පවතී. ජනතාව 6,700 ක් වෙසෙන හීල්ස්විල් නගරය, ආසන්නව පැතිරෙන ලැව්ගිනි හේතුවෙන්, තදබල අනතුරුදායක තත්වයකට පත්ව ඇති බව තිරසාර සහ පාරිසරික දෙපාර්තමේන්තුව අද අනතුරු ඇඟවීය. මෙම සති අන්තය තුල ඇතිවිය හැකි ග්‍රීස්ම කාලගුනය තුල රටෙහි නව ලැව්ගිනි ආරම්භයක් බලාපොරොත්තු වේ.

පලමු කම්පනයෙන් පසුව, මෙම ශෝකාන්තය ගැන මහජන කෝපය වැඩෙමින් පවතී. පුවත්පත්වලට ලැබෙන ලිපිවලින් රජය දෝෂදර්ශනයට ලක්කර ඇති අතර පෙර පැවති ලැව්ගිනිවලින් ඉගෙන ගත් පාඩම්වලින් ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත්වීම ප්‍රශ්න කර ඇත.

කොබර්ග්හි පෝල් ග්ලීසන් ඒජ් පුවත්පතට ප්‍රකාශ කලේ, "සෑම දිනකම අප අවදිවනවිට දැනගන්නේ ලැව්ගිනි හේතුවෙන් ඇතිවූ මරන සංඛ්‍යාව වැඩිවී ඇතිබවයි. ආරක්ෂක වියදම් ගිනි නිවන හෙලිකොප්ටර් මිලදී ගැනීමට යෙදවීමට බලකරන්නට කාලය පැමින ඇත. යුධ ගුවන්යානා ඇනවුම් නතර කරන්න, සබ්මැරීන් නිෂ්පාදනය නොකරන්න, ලැව්ගිනිවලින් බේරීමට නිවහන් ඉදිකරන්න."

වෙනත් ලිපියක, තම වීදියේ සියලු නිවාස ලැව්ගිනි නිසා විනාශ වී ඇති බව කින්ලේක්හි ඇලෙක්ස් සහ මාර්ෂියා ලෙනාර්ඩ් පෙන්වා දෙති. "ගිනි ඇතිවීමට පෙරාතුව අප්‍රමානවත් ගිනි කලමනාකරනය නිසා අපේ ජන සමූහය නිරාවරනයට සහ අනාරක්ෂිතභාවයට ඇද දැමුනි. වටකොට ඇති කැලෑ තුල වසර සියයකට ආසන්න කාලයක් තුලදී ගොඩගැසුන ගිනිගතහැකි දේ සමග වසර 10 ක නියගයත් එකතුවීමෙන්, සම්පත් අවම වූ සමස්ත ජන සමූහයම ගින්න තුලින් ඇතිවිය හැකි අවදානමට ඇද දැමුනි."

ලැව්ගිනිවලට ප්‍රතිචාර දැක්වීම තනිතනිව තීරනය කරන්නට වැඩි අවදානම් සහිත ප්‍රදේශවල නිවැසියන් මත මුලු වගකීම පැවරූ ආන්ඩුවේ "නැවතී සටන්කිරීම හෝ ඉවත්වීම" ප්‍රතිපත්තිය සම්බන්ධව මහජන විවාදයක් පැනනැගී ඇත. 1983 පෙබරවාරියේ අලු බදාදා ගින්නෙන් අනතුරුව ක්‍රියාත්මක කල මෙම ප්‍රතිපත්තිය, ඔස්ට්‍රේලියානු ග්‍රීස්ම ඍතුවේදී සදා පවත්නා අන්තරායක් සම්බන්ධව රජයේ වියදම් නොමැතිවීම යුක්තිසහගත කරන්නට පාවිච්චි කරන ලදී.

පසුගිය සතියේ පැවති තත්වයන් යටතේ නිවාස බේරාගැනීම කලනොහැක්කක්ව පැවති බව මාධ්‍යවේදීන්ගේ, අනතුරෙන් අනූනවයෙන් බේරුනු අයෙකුගේ විස්තරවලින් සහ හදිසි සේවා සේවකයෙකුගේ වාර්තාවලින් ගෙනහැර දැක්වේ. තමන්ගේ නිවාස බේරාගන්නට උත්සාහකිරීමේදී හෝ දොලොස් අවුරුදු නියගයෙන් සහ සෙන්ටිග්‍රේඩ් 46ට වැඩි උෂ්නත්වයෙන් උපන් ගිනිදැල්ලෙන් බේරී පලායෑමට ගත් උත්සාහයේදී මෝටර් රථ තුල බොහෝ දෙනා මරනයට පත්වූහ.

උෂ්නත්වය සහ ආර්ද්‍රතාවය අනුව සැකසෙන ඔස්ට්‍රේලියානු ගිනි අනතුරු දර්ශකයට අනුව රේට්ටුව 50 ට වැඩි වීම අනතුරුදායක වේ. ගිය සෙනසුරාදා මෙම දර්ශකය පස් හය ගුනයකින් ඉහල ගිය බව වාර්තා විය.

## ආන්ඩුවේ සැගවීම

මහජන විවේචන වැඩිවන තතු තුල, සැලැස්මක් හෝ සුදුසු අනතුරු ඇඟවීමේ ක්‍රමයක් නොමැතිවීම සහ ප්‍රමානවත් ගිනි නිවීම් සම්පත් නොමැති වීම පිලිබඳ තම වගකීමෙන් පැන යාමේ මංමුලාසහගත උත්සාහයක මධ්‍යම සහ ෆෙඩරල් ආන්ඩු නිරතව සිටී.

ලැව්ගිනි, ඔස්ට්‍රේලියාවේ වඩාත් නරකම ස්වාභාවික විපත ලෙසට අගමැති කෙවින් රඩ් ප්‍රසිද්ධ කල අතර මරනයට පත්වූ අයට ගෞරව කරනු වස් ශෝක දිනයක් ප්‍රකාශයට පත් කලේය. වික්ටෝරියා අගමැති ජෝන් බ්‍රම්බි රාජකීය කොමිසමක පරීක්ෂනයක් ප්‍රකාශයට පත් කලේය.

කෙසේවුවත්, මූලික වෙනස්කම් කිසිවක් සිදු නොවනු ඇති බවට දැනටමත් පැහැදිලිය. රාජකීය කොමිසමක් රැස්කරන්නට පෙරම මධ්‍යගත ඉවත්කිරීමේ ප්‍රතිපත්තියක නොහැකියාව පිලිබඳව අගමැති බ්‍රම්බි බදාදා මාධ්‍ය වලට පැවසුවේය.

"මධ්‍ය හෝ ඉහල ගිනි අවදානමක් ඇති සෑම විටම ඔබ සියල්ලන් ඉවත්කරන්නට යනවා නම්, ඔබ ඇත්තටම කතාකරන්නේ මිලියන භාගයක මිනිසුන් ගැනයි. අවංකවම, ඔබට මිලියන භාගයක මිනිසුන් ඉවත් කරන්න බැහැ, සරලවම එය ප්‍රායෝගික නෑ." ඔහු පැවසීය.

නවතම අනතුරු ඇඟවීමේ පද්ධති සහ හදිසි සේවා සමග සුදුසු ඉවත්කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම කල නොහැක්කකක නොව කාලය සහ මුදල් පිලිබඳ කාරනාවක් වන අතර, එවැනි ආයෝජනයකට මධ්‍යම හෝ ෆෙඩරල් රජයන් සූදානම් නැත.

බොහෝ ඇසින් දුටුවන්ට අනුව, ගිය සෙනසුරාදා තත්වය සම්පූර්නයෙන්ම අවුල් ජාලාවක් විය. ගින්නේ අලුත්ම තත්වය සහ හදිසි අනතුරු ඇඟවීම් දැන ගැනීම සඳහා බොහෝ ගිනි අවදානම සහිත ප්‍රදේශවල නිවැසියන්ට ප්‍රාදේශීය ඒබීසී ගුවන් විදුලි සේවය ඇමතීමට බලකෙරින.

ගින්නට පෙරත් පසුවත්, අනෙකුත් ප්‍රදේශ සම්පූර්නයෙන්ම හුදකලා වී තිබින. උදාහරනයක් හැටියට, තම නිවාස ගින්නෙන් පොලවට සමතලාවුන අසල්වැසි මේරිස්විල්හි 150 ක් වූ ජනතාවට නවාතැන් පහසුකම් සහ ආවරන සැපයීම නාර්බෙතොන් ප්‍රදේශයේ සමාජ ශාලාවකින් සිදු කෙරුනද, දින දෙකකට එම ප්‍රදේශය පිටස්තර ලෝකයෙන් කපාහැර දමා තිබිනි. අගහරුවාදා වන විට සම්බන්ධතාවය මුලින්ම ගොඩ නගා ගත්තේ මාධ්‍ය කන්ඩායමක් විසිනි.

සෙනසුරාදා ලැව්ගින්නේ ඉහලයාමේදී, වික්ටෝරියාහි හදිසි සේවා දුරකතනය 4,000 කට වැඩි ඇමතුම් සංඛ්‍යාවකින් ඉතිරී ගියේය. 14 ක් පමනක්වූ තම සියලු දුරකතන ක්‍රියාකරුවන් එම දිනයේ සේවයේ යෙදවුවත්, නිවාස හා වාහන තුල කොටුවී සිටි අනතුරට පත්වූවන්ගේ නොඉවසිලිවන්ත ඇමතුම්වලට පිලිතුරුදීමට නොහැකි විය.

ලැව්ගිනි කලාපවල පාලනය කරන ලද ඇවිලීම් සුදුසු ලෙස කරගෙනයාමට මධ්‍යම රජය "ස්ථිරවම අපොහොසත්වීම" වික්ටෝරියා ප්‍රාන්තයේ විගනකාධිපති 2003 වසරේ නිකුත් කරන ලද වාර්තාවකින් විවේචනය කලේය. ලැව්ගිනි ප්‍රදේශවල ස්වේච්ඡා සැලසුම් පාලනයන් ඇතිකිරීමට මධ්‍යම ගිනි අධිකාරිය විසින් ආවරනය කෙරෙන සමහර නගර සභාවන් පමනක් ක්‍රියා කල බව එම වාර්තාවේ සඳහන් වේ. ඒ සමගම ගිනි අධ්‍යාපන වැඩ සටහන් " අප්‍රමානවත්" බවද පවසා ඇත.

වාර්තාවට අනුව, මෙල්බෝර්න්හි නිරිතදිග පෙදෙසේ ඇති අධික ලෙස දැව සහිත කඳුවැටි කලාපයක් වන ඩැන්ඩෙනොන්ස්හි කල සමීක්ෂනයකදී අඩකට ආසන්න නිවැසියන්ගේ ප්‍රතිචාර වලින් පෙනීගියේ, ගිනි සයිරන් මගින් අනතුරු ඇගවියයුතු බවට ඔවුන් විශ්වාස කරන බවයි. මීට පෙර අවුරුදු වලදී, ගිනි ඇවිලිය හැකි නගර සහ කුඩා ගම්වල නිවැසියන්ට අනතුරු ඇඟවීමට සයිරන් නලා සහ අනතුරු ඇඟවීමේ සීනු පාවිච්චි කෙරින. මේවා තව දුරටත් නොපවතී.

වික්ටෝරියාවේ ලැව්ගිනි ප්‍රදේශවල නිවාස ආවරනය කරන ගිනි වලක්වන ගොඩනැගිලි සංඥා වර්තමාන තත්වයන්ට අප්‍රමානවත් බවද ගිනි විශේෂඥයෝ පෙන්වා දුන්හ.

ඊලඟ දොලොස් මස ඇතුලතදී, ජාතික හදිසි නිවේදන සේවයක් ස්ථාපිත කරන බවට බ්‍රම්බි සහ රඩ් ප්‍රකාශ කර ඇති නමුදු, මධ්‍යම සහ ෆෙඩරල් රජයන් විසින් මීට පෙර වසර වලදී ඒ හා සමාන යෝජනා මූල්‍යමය කරුනු මත ප්‍රතික්ෂේප කෙරිනි.

2005 වසරේ වික්ටෝරියාවේ ගිනි අධික ප්‍රදේශවලදී, දුරකතන හරහා සහ කෙටි පනිවිඩ හදිසි නිවේදන සේවයක් වික්ටෝරියා රාජ්‍ය හදිසි සේවාව විසින් සාර්ථකව අත්හදා බලන ලදී. කෙසේවුවත්, ෆෙඩරල් ආන්ඩු (ලේබර් හා ලිබරල්) සහ මධ්‍යම රජයද, ඇස්තමේන්තුගත ඩොලර් මිලියන 20 ක මුදල කවුරු විසින් දැරිය යුතුද යන්න ගැන තවමත් දබර කර ගනිමින් සිටිති.

## ගිනි තැබීම් හඹායෑම

ආන්ඩු වෙත එල්ල කෙරෙන මහජන විවේචන වෙනතකට හැරවීමට, ගින්නේ වගකීම "ගිනිතබන්නන්" මතට පටවා විකාර වටපිටාවක් ඇතිකරලීමට මාධ්‍යයන් දැනුවත්ව වැඩට බැස ඇත.

අගහරුවාදා මර්ඩොක්ගේ ඔස්ට්‍රේලියන් පුවත්පතේ ප්‍රචන්ඩකාරී කතුවැකියක මාතෘකාව වූයේ, "ගින්නේ වේදනාව, ගිනිතැබීමේ නපුර" යන්නයි. එය ඍජුවම ප්‍රකාශකලේ "මේ තරම් ජීවිත සංඛ්‍යාවක් නැතිවුනේ ඇයි, අනතුරු ඇඟවීම් ප්‍රමානවත් වූවාද හෝ සම්පත් යෙදවීම අක්‍රමවත්ද යැයි ප්‍රශ්න කිරීමට කාලය මෙය නොවේ" යනුවෙනි. එය ඉස්මතු කල නියම කාරනාව නම්, ගිනිතැබීම දැනුවත්ව සිදුවුනාද යන්නත් "ඉතා බරපතල දඬුවම්වල" අවශ්‍යතාවයත්ය.

අනෙක් අයත් එම තේමාව අරගත්තේය. ගිනිතබන්නන් "ජන ඝාතකයන්" ලෙසට අගමැති රඩ් හෙලා දැක්කේය. වඩා ඉහලින් සිටින්නේ නැතිව බ්‍රම්බි සහ දකුනු ඔස්ට්‍රේලියානු අගමැති මයික් රැන් ඔවුන් "ත්‍රස්තවාදීන්" ලෙස හැඳින්වීය. ඕනෑම ගිනිතබන්නෙක් හට ඝාතන ගනනක චෝදනාවන්ට මුහුන දීමට සිදුවන බවත්, වරදකරු වුවහොත්, තම ඉදිරි ජීවිතකාලය පුරාවට සිර දඬුවම් විඳිය යුතු බවත්, ෆෙඩරල් නීතිපති රොබට් මැක්ලන්ඩ් නිවේදනය කලේය.

චර්චිල් සහ මේරීස්විල් ගිනි හිතාමතාම තැබූ ඒවා විය හැකි බව, බදාදා ඒබීසී රූපවාහිනියේ "ලේට්ලයින්" වැඩසටහනේ පෙනීසිටි වික්ටෝරියා පොලිස් කොමසාරිස් ක්‍රිස්ටීන් නික්සන් චෝදනා කල නමුත්, කිසිඳු පිලිගතහැකි සාක්ෂියක් ඉදිරිපත් නොකලේය. කිසියම් හෝ ගින්නක් හිතාමතාම ගිනිතැබුවේදැයි පරීක්ෂාකිරීමට විශේෂ කන්ඩායමක් ස්ථාපිත කල වික්ටෝරියා පොලීසිය, ඊනියා ගිනි තබමින් යන්නෙකු හා සමාන පින්තූරයක් නිකුත්කලේය. කිසිඳු අත්අඩංගුවට ගැනීමක් සිදුකර නැත.

කෙසේ වුවද, කාර්ය සාධක බලකාය මෙහෙයවන සහකාර පොලිස් කොමසාරිස් ඩැනී මොලොනි, හිතුවක්කාර කැරලි සහගත මානසිකත්වයක් ඇතිවෙමින් පවතින බවට බදාදා උදෑසන විස්තර කල අතර සාමකාමී වන්නට ආයාචනා කලේය. "ඇත්තටම සම්පූර්නයෙන්ම අහිංසක විය හැකි පුද්ගලයන්ට බොහෝ ඇඟිලි දිගුවෙමින් තිබේ. ඇත්තටම ඔබ අහිංසක නම් ඔබ සැක කිරීම කෙතරම් නම් අපරාධයක්ද. අපරාධයක් සිදුවනවාද එසේනම් ඊට කවුරුන් වගකිවයුතුද යැයි හඳුනාගනිමු." ඔහු අනතුරු ඇඟවීය.

මාධ්‍ය සහ දේශපාලකයින්ගේ නින්දාශීලී පිලිපැන්නීම් සහ සීමිත රාජ්‍ය ආධාර සැපයීම්, සාමාන්‍ය කම්කරු ජනතාවගේ ත්‍යාගශීලීත්වයට පූර්න විරුද්ධ පාර්ශ්වය විය. පලමු දෙදින තුල ඩොලර් මිලියන 35 කට වැඩි ආධාර සමග, දැනට ඩොලර් මිලියන 75 කට වඩා මහජන ආධාර ඉහල නැග ඇත. ලැව්ගින්නෙන් විපතට පත්වූවන් හට ආහාර, නිවහන්, ඇඳුම්, දරුවන්ට සෙල්ලම් බඩු, වෛද්‍ය සත්කාර සහ අනෙකුත් ප්‍රතිපාදන සැපයීමේ සේවාවට, මිනිස්සු දහස් ගනනක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූහ.

තමන්ගේ දුරකතන සේවය ඇමතුම්වලින් ඉතිරී ගොස් ඇති බැවින්, තම කාර්යාලවලට ඇමතුම් නොදී අන්තර්ජාලය හරහා ආධාර කරන්නැයි ආයාචනා කරමින් රතු කුරුසය නිවේදනයක් නිකුත්කිරීමෙන්ම මහජන ආධාර වල තරම පෙනේ. සති දෙකක් පුරා නිවාස සහ පාරවල් ජලයෙන් යටවී තිබුන උතුරු ක්වීන්ස්ලන්තයේ ඉන්හැම්හි බොහෝ ගංවතුරට ගොදුරුවූවන් තමන්ට ලැබුන ඩොලර් 1000 ක රජයේ සහන දීමනාව පවා ආධාර වශයෙන් දුන්හ.

ආධාර මහෝඝය තුලින් පෙන්නුම්කල මූලික සමාජ සාමූහිකත්වය, සමාජ ක්‍රමයේ අමානුෂිකත්වය සහ සියලුදේට පෙර පුද්ගලික ලාභය පෙරමුනෙහි තබන එහි දේශපාලන ආරක්ෂකයින්ව එලිදරව් කරයි.

© www.wsws.org